# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2023

## 8 ශ්‍රේණිය

## පෙරදිග සංගීතය                    කාලය : පැය 02

### I පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **1 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) භූපාලි රාගයට අයත් ස්වර වනුයේ,

i) ස රි ම ප නි
ii) ස රි ග ප නි
iii) ස රි ග ප ධ
iv) ස ග ම ප ධ

(2) මාත්‍රා 2 සහ මාත්‍රා 3 රිද්ම රටාව මිශ්‍ර වීමෙන් නිර්මාණය වී ඇති හින්දුස්ථානී තාලය කුමක්ද?

i) දාදරා තාලය
ii) ජප් තාලය
iii) දීප්චන්දි තාලය
iv) කෙහෙර්වා තාලය

(3) මාත්‍රා 14කින් යුක්ත හින්දුස්ථානී තාලය වනුයේ,

i) දීප්චන්දි
ii) ජප් තාලය
iii) කෙහෙර්වා
iv) දාදරා

(4) මිශ්‍ර මත්කැට් සහිත හින්දුස්ථානි තාල යුගලය ඇතුළත් වරණය තෝරන්න.

i) ලාවණී - කෙහෙර්වා
ii) දාදරා - ජප්තාලය
iii) දීප්චන්දි - දාදරා
iv) ජප්තාලය - දීප්චන්දි

(5) දීප්චන්දි තාලයට අයත් රිද්ම රටාවන් වනුයේ,

i) / × × / × × – / × × / × – – /
ii) / × × × / × × × / × – × / × – – /
iii) / × × × × / × – – – / × × × – / × – – – /
iv) / × × × / × – – – / × – × / × – – – /

(6) රිෂභය (රි) සහ ගාන්ධාරය (ග) ස්වරය අතර ඇති ස්වරය කුමක්ද?

i) කෝමළ රිෂභය (<u>රි</u>)
ii) පංචමයයි (ප)
iii) කෝමළ ගාන්ධරයයි (<u>ග</u>)
iv) මධ්‍යමයයි (ම)

(7) දෙවියන්ගේ ගුණ වර්ණනා කරමින් ගයන හින්දුස්ථානී සරල ශාස්ත්‍රීය ගායනයක් වනුයේ,

i) නූර්ති ගී
ii) භජන් ගී
iii) නාඩගම් ගී
iv) උපදේශාත්මක ගී

(8) ලඝු අකුරකට හිමි මාත්‍රා සංඛ්‍යාව කීයද?

i) එකකි
ii) දෙකකි
iii) තුනකි
iv) හතරකි

(9) / සුවඳ / හමන / මල්නෙ / ලා ऽ ऽ /

ඉහත ගී පදයට අයත් සඳැස්මක් ගණන කීයද?

i) 9 කි
ii) 10 කි
iii) 11 කි
iv) 12 කි

(10) බටහිර සංගීතයේදී මාත්‍රා හතරක වටිනාකම දක්වන සංකේතය කුමක්ද?

i) Quaver (ක්වේවර්) iii) Crotchet (ක්‍රොචෙට්)
ii) Semibreve (සෙමිබ්‍රිව්) iv) Minim (මිනිම්)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වරහන් තුළ දී ඇති පිළිතුරු අතුරින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන් පුරවන්න.**

**(ගීමත් / සඳැස්මත් / ලඝු / ගුරු / තබ්ලාව / නාඩගම් / පියගුණ / ආරම්භක)**

(11) මාත්‍රා දෙකක් ඇත්තේ ........................................... අක්ෂරයටය.

(12) නූර්ති නාට්‍ය සංගීතයේ ප්‍රධාන තාලවාද්‍ය භාණ්ඩය ........................................... යි.

(13) "අම්මා සඳකි මම ඒ ලොව" ගීතය ........................................... ගීයකි.

(14) ගී පාදයක් ගායනයේදී ලැබෙන සම්පූර්ණ මාත්‍රා ගණන ........................................... නමින් හඳුන්වයි.

(15) ගීතයක් ගායනයේදී Introduction (INTRO) යනුවෙන් හඳුන්වනුයේ ...........................................
වාදනයයි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් හරි (√) ලකුණද, වැරදි නම් (×) ලකුණ ද යොදන්න.**

(16) භූපාලි රාගයට ඇත්තේ ස්වර පහක් පමණි. ( )

(17) ජප් තාලයට මාත්‍රා 10ක් ඇත. ( )

(18) මද්දලය වයමින් නූර්ති ගී ගයයි. ( )

(19) Minim (මිනිම්) දෙකක වටිනාකම Semibreve එකක වටිනාකමට සමාන වේ. ( )

(20) කුඹුරේ වල්පැල ගැලවීමේ දී ද නෙළුම් ගී ගායනා කරයි. ( )

$(2 \times 20 = 40)$

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

(1) භූපාලි රාගාශ්‍රිත ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්ථාර කරන්න. (ලකුණු 12)

(2) ජප් තාලය හෝ දීප්චන්දි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 12)

(3)

i) ගැමි ගීයේ විශේෂ ලක්ෂණ 3ක් ලියන්න. (ල. 6)

ii) ඔබ උගත් නෙළුම් හෝ කමත් ගීයක් ලියන්න. (ල. 6)

(4) i) නූර්ති සහ නාඩගම් නාට්‍ය පිළිබඳ කරුණු පහත දක්වා ඇත. ඒවා නූර්ති සහ නාඩගම් යටතේ වෙන්කර ලියන්න.

1. මද්දල දෙකක් වාදනය කරයි.
2. 'ශ්‍රී වික්‍රම රාජසිංහ' නමින් නාට්‍යක් ඇත.
3. සර්පිනාව, තබ්ලාව, වයලීනය වාදනය කරයි.

4. කර්ණාටක සංගීතයේ ඇසුර ලබා ඇත.

5. මනමේ සහ සිංහබාහු යන නව නාට්‍ය සඳහා ඇසුරු කොටගෙන ඇත.

6. 'බලිවාලා' නාට්‍ය සම්ප්‍රදාය ඇසුරු කොට ගෙන ඇත.

7. හින්දුස්ථානි සංගීතයේ ඇසුර ලබා ඇත.

8. වෙස්සන්තර හා කාලගෝල නමින් නාට්‍ය ඇත. (ල. 8)

ii) ඔබ දන්නා නූර්ති හෝ නාඩගම් ගීයක මුල් කොටස ලියන්න. (ල. 4)

(5)

i) පහත දැක්වෙන ගී පාදයේ සඳැස්මක් හා ගී මත් ගණන ලියන්න.

/ඈ S ති න්/ඇ සෙ නා S/ගී S නා S /දේ S S S/ (ල. 6)

ii) යතිය යනු කුමක්ද?

(ල. 6)

(6) පහත දැක්වෙන පෙරදිග ස්වර ප්‍රස්තාරය බටහිර සංගීතයට අනුව රේඛා මණ්ඩලයේ ප්‍රස්තාර කරන්න.

/ ස ස ග ග / රි රි ග - / ස ස රි රි / ග - - - / (ල. 12)

(7) ස්වර පුවරුවක රූප සටහනක් ඇඳ එහි ස රි <u>ග</u> ම ප ධ <u>නි</u> ස̇ යන ස්වර ලකුණු කරන්න. (ල. 12)